# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2089/57 - 2018 සැප්තැම්බර් මස 22 වැනි සෙනසුරාදා - 2018.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය )**

**7 වන වගන්තිය යටතේ දැන්වීමයි**

*මගේ අංකය* - DS/GFG/L&L/5/95.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ.*
*අංකය* - 4-3/11/2017/UD/71.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගාල්ල මහ නගර සභා සීමාව තුළ 96B ගල්වඩුගොඩ, 96Hමිනුවන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගල්වඩුගොඩ සහ මිනුවන්ගොඩ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද මු.පි.ගා. අංක 4373 දරණ මූලික පිඹුරේ කැබලි අංක 1,2,3,4,5,6 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0068 ක් වූ පහත නම්වලින් හා මායිම්වලින් යුත් බිම් කොටස් සඳහා මායිම්:

කැබලි අංක 1
ඉඩමේ නම: සොයාගත නොහැක; හිමිකම් කියන අය : රජය; ඉඩම් පරිහරණය : ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා : ලක්ෂ්මන් ආනන්ද; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0002ක් පමණ වේ.

කැබලි අංක 2
ඉඩමේ නම : දුවෙවත්ත; හිමිකම් කියන අය : රජය; ඉඩම් පරිහරණය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා : ස්ටෙලා නාගහවත්ත; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0002ක් පමණ වේ.

කැබලි අංක3
ඉඩමේ නම : අලුත් අස්වැද්දුම; හිමිකම් කියන අය : රජය; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; මුල් හිමිකම් පාන්නා : අසෝක ගුණසේකර; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0007ක් පමණ වේ.

කැබලි අංක 4
ඉඩමේ නම : දුවෙවත්ත,තල්ගහවත්ත හෙවත් ලන්සියාවත්ත, හිමිකම් කියන අය : රජය; ඉඩම් පරිහරණය : ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා : කේ.ඒ.ප්‍රියංකර ; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0003ක් පමණ වේ.

කැබලි අංක 5
ඉඩමේ නම : සොයාගත නොහැක; හිමිකම් කියන අය : රජය; ඉඩම් පරිහරණය : ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා : වී.බී.සේපාලි ධම්මිකා දන්තනාරායන; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0048 ක් පමණ වේ.


1A - G28578 – 17 (2018/09)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංක 6**

ඉඩමේ නම : සොයාගත නොහැක; හිමිකම් කියන අය : රජය; ඉඩම් පරිහරණය : ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා : සොයාගත නොහැක; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0006 ක් පමණ වේ.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018.10.03 වැනි දින පෙ.ව. 9.00 ට ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018.09.26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම /පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූහැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අයි. හිමාලි රත්නවීර.
ප්‍රාදේශීය ලේකම් *(වැ. බ.)*
කඩවත්සතර - ගාල්ල

10-168

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.